## ශීර්ෂය 155 - අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 21 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

--------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඈ) වගන්තිය සහ 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබූ බව.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශ අනුව මුළු පුනරාවර්තන වියදම රු.මිලියන 9,027.80ක් වී තිබුණත්, එය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ රු.මිලියන 9,031.13 ක් ලෙස රු.මිලියන 3.33 කින් වැඩියෙන් දක්වා තිබුණි. ඒ අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ 2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 3.33 කින් අඩු වී තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව නිවැරදිව මූල්‍ය ප්‍රකාශ සකස් කළ යුතු ය. | භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අතර පුනරාවර්තන වියදමේ වෙනස රු.මිලියන 3.33ක් වන අතර එම වෙනස අභ්‍යන්තර කටයුතු අංශයේ ගිණුමේ නොගැලපීමකි. |
| (ආ) 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සංඛ්‍යා භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශවල සඳහන් සංඛ්‍යා පදනම් කරගෙන පිළියෙල කළ යුතුව තිබුණි. නමුත් 2019 වර්ෂයේදී භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශය අනුව අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු.මිලියන 443.83 ක් හා රු.මිලියන 1,810.62 ක් විය යුතුව තිබුණත්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය පිළිවෙලින් රු.මිලියන 448.00 ක් හා රු.මිලියන 1,786.85 ක් වශයෙන් දක්වා තිබුණි. ඒ අනුව අත්තිකාරම් ලැබීම් රු.මිලියන 4.17කින් වැඩියෙන් ද, අත්තිකාරම් ගෙවීම් රු.මිලියන 23.77කින් අඩුවෙන් ද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව නිවැරදිව මූල්‍ය ප්‍රකාශ සකස් කළ යුතුය. | ඔබගේ විගණන විමසුමෙහි අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් ලෙස පිලිවෙළින් රු.මිලියන 448.83ක් හා රු.මිලියන 1,810.62ක් ලෙස සඳහන් වුව ද භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශ අනුව අත්තිකාරම් ලැබීම් රු.මිලියන 443,83ක් ලෙස නිවැරදි විය යුතුය.අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සටහන් කිරීමේදී විමසුමේ සඳහන් පරිදි අත්තිකාරම් ලැබීම් රු.මිලියන 4.17ක් වැඩියෙන් හා අත්තිකාරම් ගෙවීම් රු.මිලියන 23.77ක් අඩුවෙන් සටහන් වී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉහත (ආ)හි සඳහන් පරිදි චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා පොදු තැන්පත් ගිණුමේ අත්තිකාරම් ලැබීම් රු.මිලියන 6.39 ක් හා ගෙවීම් රු.මිලියන 6.39 ක් වශයෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අඩුවෙන් දක්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව නිවැරදිව මූල්‍ය ප්‍රකාශ සකස් කළ යුතුය. | පොදු තැන්පත් ගිණුමේ ලැබීම් හා ගෙවීම් රු.මිලියන 6.39ක් අඩුවෙන් සටහන් වීමක් සිදුවී ඇත. |
| (ඈ) | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(ii) ඡේදය ප්‍රකාරව වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් එකතු කරන ලද ආදායම් වෙනත් ලැබීම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දැක්විය යුතුව තිබුණි. අමාත්‍යාංශයේ ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරින්ට අදාළ ආදායම් සංකේත 09ක් යටතේ අමාත්‍යාංශය එකතු කළ ආදායම රු.මිලියන 78.23ක් වී තිබුණි. එහෙත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එම ලැබීම රු.මිලියන 86.54ක් ලෙස රු.මිලියන 8.31 ක් වැඩියෙන් දක්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව නිවැරදිව මූල්‍ය ප්‍රකාශ සකස් කළ යුතුය. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් ලෙස දක්වා ඇත්තේ අත්තිකාරම් බී ගිණුමේ පොලී ආදායම, ආදායම් ගිණුම හා වැය විෂයන්හි අධිභාර කිරීම්වලට ආදී වශයෙන් ලැබුණු මූල්‍යමය ලැබීම් වේ. |
| (ඉ) | චක්‍රලේඛයේ 3.5 ඡේදය අනුව එක් එක් වැය විෂය සංකේතයක් යටතේ සෑම වැය විෂයයක් වෙනුවෙන්ම මුළු ශුද්ධ ප්‍රතිපාදනය හා සත්‍ය වියදම අතර වෙනස හා මෙම වෙනස මුළු ප්‍රතිපාදනයෙන් සියයට 5 හෝ රු.10,000 යන දෙකෙන් කවර හෝ වැඩි මුදලට දායකත්වය වඩා වැඩි වන්නේ නම් ඒ සඳහා ඉදිරිපත් කළ යුතු හේතු ඒසීඒ2 II හි පෙන්විය යුතු වුවත් වැය විෂය සංකේත 112 ක ප්‍රතිපාදන නියමිත සීමාවට වැඩියෙන් ඉතිරි වී තිබියදී හේතු දක්වා ඒසීඒ2 II ආකෘතිය ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව නිවැරදිව මූල්‍ය ප්‍රකාශ සකස් කළ යුතු ය. | ප්‍රධාන කාර්යාල ගිණුම සමඟ උප කාර්යාලයන්හි ගිණුම් විගණනයට ඉදිරිපත් කළ අතර, ACA 2-ii හි අදාළ විස්තර එම උපකාර්යාලයන්හි මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා ඇත. |

## 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් සංඛ්‍යා භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශවල සඳහන් සංඛ්‍යා පදනම් කර ගත යුතුව තිබුණි. භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශ අනුව දේපළ, පිරියත හා උපකරණවල 2019 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.මිලියන 1,496.23ක් වී තිබුණත්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එම වටිනාකම රු.මිලියන 509.40ක් අඩුවෙන් රු.මිලියන 986.83ක් වශයෙන් දක්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව නිවැරදිව මූල්‍ය ප්‍රකාශ සකස් කළ යුතු ය. | භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශයන්හි දේපළ පිරියත හා උපකරණ වටිනාකම රු.මිලියන 1,496.23 ක් ලෙස සටහන් වුවද උප කාර්යාලයන්හි දේපළ පිරියතයන්හි සත්‍ය වටිනාකම් පහත පරිදි විය.<br><br>**පළාත් පාලන සහ පළාත් සභා අංශය - රු.මිලියන 510.94**<br>**ස්වදේශ කටයුතු අංශය - රු.මිලියන 434.31**<br>**අභ්‍යන්තර කටයුතු අංශය - රු. මිලියන 41.58**<br>ඒ අනුව සත්‍ය දේපළ පිරියත වටිනාකම රු.මිලියන 986.83 කි. අදාළ වෙනසට හේතුව **CIGAS** වැඩසටහනේ සිදු වී ඇති තාක්ෂණික දෝෂයක් වන බැවින් එය නිවැරදි කිරීමට අදාළ අංශ දැනුවත් කර ඇත.ඒ අනුව මූල්‍ය තත්ව ප්‍රකාශයන්හි දක්වා ඇති දේපළ පිරියත ශේෂය නිවැරදි වේ. |
| (ආ) | ඉහත චක්‍රලේඛයේ 7(v) ඡේදය ප්‍රකාරව ශුද්ධ වත්කම්වල වටිනාකම ලබා ගත යුතු අකාරය අනුව කටයුතු නොකිරීම නිසා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සඳහන් ශුද්ධ වත්කම් වටිනාකම රු.915,819 ක් අඩුවෙන් රු.මිලියන 1,190.00 ක් ලෙස දක්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව නිවැරදිව මූල්‍ය ප්‍රකාශ සකස් කළ යුතු ය. | මැතිවරණ රාජකාරි සඳහා ගෙවූ රු.මිලියන 0.9ක මුදලක් නොපියවූ අත්තිකාරම් වශයෙන් පවතින හෙයින් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ සඳහන් ශුද්ධ වත්කම් වටිනාකම නිවැරදි වේ. |

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම රු.මිලියන 78.10ක් වී තිබුණත්, එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ රු.මිලියන 7.47ක් වැඩියෙන් රු.මිලියන 85.57ක් ලෙස දක්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව නිවැරදිව මූල්‍ය ප්‍රකාශ සකස් කළ යුතු ය. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් ලෙස දක්වා ඇත්තේ අත්තිකාරම් බී ගිණුමේ පොළී ආදායම, ආදායම් ගිණුම හා වැය විෂයන්හි අධිභාර කිරීම් වලට ආදී වශයෙන් ලැබුණු මූල්‍යමය ලැබීම් වේ. |
| (ආ) | ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව පෞද්ගලික පඩිනඩි හා මෙහෙයුම් වියදම්, සහනාධාර හා මාරුකිරීම් සහ වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් පිළිවෙලින් රු.මිලියන 3,258.58ක්, රු.මිලියන 163.51 ක් හා රු.මිලියන 202,661.96 ක් වී තිබුණි. නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වෙනුවෙන් වැය කළ මුදල් පිළිවෙලින් රු.මිලියන 691.98 ක්, රු.මිලියන 142.47 ක් හා රු.මිලියන 202,645.09 ක් වශයෙන් දක්වා තිබුණි. මේ නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙනුවෙන් වැය කළ මුදල් ප්‍රවාහය රු.මිලියන 2,604.50 ක් අඩුවෙන් රු.මිලියන 203,492.24 ක් ලෙස දක්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව නිවැරදිව මූල්‍ය ප්‍රකාශ සකස් කළ යුතු ය. | ඔබගේ විගණන විමසුම අනුව ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්, සහනාධාර හා මාරු කිරීම් සහ වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් ලෙස සඳහන්ව ඇති මුදල නිවැරදි නොවන අතර එම මුදල රු.මිලියන 203,478.42ක් ලෙස නිවැරදි විය යුතු ය. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් ලෙස සඳහන් වන රු.මිලියන 203,479.54ක් මුදල සහ ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුමෙහි සඳහන් රු.මිලියන 203,478.42ක මුදල අතර පවතින වෙනස හරස් සටහන් මඟින් ගිණුම්ගත වන අගයන් වේ. |
| (ඇ) | ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව අත්තිකාරම් අයකර ගැනීම රු.මිලියන 47.95 ක් වී තිබුණත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ එම වටිනාකම රු.මිලියන 24.84 ක් අඩුවෙන් රු.මිලියන 23.11ක් වශයෙන් දක්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව නිවැරදිව මූල්‍ය ප්‍රකාශ සකස් කළ යුතුය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරනු ලබන්නේ මුදල් පදනම මතය.ඒ අනුව ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුමෙහි සඳහන් රු.මිලියන 47.96 හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇති වටිනාකම වන රු.මිලියන 23.11 අතර වෙනසට හේතුව හරස් සටහන් වශයෙන් ඇතුළත් කර ඇති ලැබීම් වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව අත්තිකාරම් ගෙවීම හා භෞතික වත්කම් අත්පත් කර ගැනීම සඳහා පිළිවෙලින් රු.මිලියන 66.93ක් හා රු.මිලියන 13.58 ක් වැය කර තිබුණත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වෙනුවෙන් වැය කළ මුදල් ප්‍රවාහයේ එම වටිනාකම් පිළිවෙලින් රු.මිලියන 51.23ක් හා රු.මිලියන 2,539.60ක් වශයෙන් දක්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව නිවැරදිව මූල්‍ය ප්‍රකාශ සකස් කළ යුතුය. | ඔබගේ විගණන විමසුමෙහි සඳහන් පරිදි ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුමෙහි සඳහන් අත්තිකාරම් ගෙවීම් රු.මිලියන 66.94 හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සඳහන් අත්තිකාරම් ගෙවීම් රු.මිලියන 51.23 අතර වෙනසට හේතුව වනුයේ හරස් සටහන් මඟින් සිදුකරනු ලබන ගෙවීම් වේ. එසේම භෞතික වත්කම් අත්පත් කර ගැනීම් ලෙස ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුමේ දක්වා ඇති රු.මිලියන 13.58 හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සඳහන් රු.මිලියන 2,539.60 අතර වෙනසක් පවතින අතර එම වෙනසට හේතුව වනුයේ වැය විෂය අංක 2102 හා 2103 යටතේ අත්පත්කරගැනීම් හැර අනෙකුත් සියලුම ප්‍රාග්ධන වැය විෂයන් වෙනුවෙන් දරන ලද වියදම් භෞතික වත්කම් ඉදි කිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් ලෙස ඇතුළත් කර ඇති බැවිනි. |
| (ඉ) | ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව තැන්පත් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු.මිලියන 124.08ක් හා රු.මිලියන 207.14ක් වී තිබුණි. නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය අනුව තැන්පත් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු.මිලියන 32.12ක් හා රු.මිලියන 191.99ක් වශයෙන් දක්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව නිවැරදිව මූල්‍ය ප්‍රකාශ සකස් කළ යුතුය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරනු ලබන්නේ මුදල් පදනම මතය.ඒ අනුව ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුමෙහි සඳහන් තැන්පත් ලැබීම් හා ගෙවීම් හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇති තැන්පත් ලැබීම් හා ගෙවීම් අතර වෙනසට හේතුව හරස් සටහන් වශයෙන් ඇතුළත් කර ඇති ලැබීම් හා ගෙවීම් වේ. |

### 1.6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව හර ශේෂ එකතුව රු.මිලියන 1,421.90ක් වුව ද සැසඳුම් ප්‍රකාශය අනුව හර ශේෂ එකතුව ලෙස රු.මිලියන 1,405.39ක් ක් දක්වා ඇති බැවින් රු.මිලියන 16.51ක වෙනසක් පැවතිණි. | හර ශේෂ එකතුවට ඇතුළත් ශේෂයන් නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කළ යුතු ය. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අතර රු.මිලියන 3.76ක වෙනසක් පැවතිය ද ඒ වෙනුවෙන් මුදල් රෙගුලාසි 427(4) ප්‍රකාරව හා 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2.1 ඡේදය අනුව ඉදිරිපත් කළ යුතු එම වෙනසට හේතු පැහැදිළි කරන සැසඳුම් ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු ය. | අදහස් දක්වා නොමැත. |

### 1.6.5 ලේඛන පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2019 මාර්තු 13 දිනැති ලිපියේ 2 ඡේදය අනුව නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වාහන මිලදී ගැනීම නව සිගාස් වැඩසටහන මගින් ඉන්වෙන්ට්‍රිගත කළ යුතු අතර එහි 3වන ඡේදය අනුව කල්බදු ක්‍රමය යටතේ මිලදී ගනු ලබන වාහන සම්බන්ධව වෙනම ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. | අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් අනුකූලව කටයුතු කළ යුතු වේ. | සිගාස් වැඩසටහනට ඇතුළත් කර ගත හැකි වැය විෂයයන් වනුයේ 2101, 2102 හා 2103 යටතේ වන වාහන මිලදී ගැනීම් පමණක් වන බැවින් වෙනත් වැය විෂයයන් යටතේ මිලදී ගනු ලබන වාහන ඇතුළත් කිරීමේ හැකියාවක් නොමැත. |

**1.6.6 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

**1.6.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| **කළමනාකරණ සේවා චක්‍රලේඛ** | | | |
| **2019 මාර්තු 05 දිනැති අංක 1/2019 චක්‍රලේඛය** | | | |
| **(i) 2.3.3 (C) ඡේදය** | රාජ්‍ය සේවයේ නියුතු නිලධාරියෙකු එක් වැඩ බැලීමේ තනතුරක පමණක් සේවයේ නියුතු කළ හැකි වුව ද චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව උතුරුමැද, ඌව යන පළාත්වල පළාත් පාලන කොමසාරිස්වරුන් මෙම අමාත්‍යාංශය යටතේ ම ක්‍රියාත්මක පුරනැගුම ව්‍යාපෘතිය, නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය හා ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවල පළාත් අධ්‍යක්ෂවරුන් හා නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් ලෙස පත්කර වැටුප් ලෙස රු.මිලියන 2.2ක් ගෙවා තිබුණි. | නීතිරීති රෙගුලාසිවලට පටහැනිව ගෙවන ලද වැටුප් අයකර, පත්වීම් විධිමත්කර චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතු ය. | ප්‍රධාන ලේකම්වරුන් විසින් 01/2019 කළමනාකරණ චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව කටයුතු කර ඇත්දැයි සොයා බලා වහා ම වාර්තා කිරීමට ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත උපදෙස් දෙන ලදී. |
| **(ii) 6.1 ඡේදය** | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව විසින් විදේශීය පුහුණු වැඩසටහන් ව්‍යාපෘති කාර්යයන් සඳහා අවශ්‍ය වන බවට නිර්දේශ කළ යුතු වුව ද එවැනි නිර්දේශයක් ලබා නොගෙන රු.මිලියන 4.29ක් වැය කර තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. | ණය ගිවිසුමේ ඇමුණුමක් වන ව්‍යාපෘති කාර්යසංග්‍රහයේ මෙම පුහුණුවීම් විස්තර දක්වා ඇති හෙයින් විශේෂ අනුමැතියක් අවශ්‍ය නොවනු ඇත. |
| **(iii) 6.2 ඡේදය** | විදේශීය පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් තේරීමේදී තරයේ ව්‍යාපෘතියේ අවශ්‍යතා මත තෝරා ගැනීම සිදු කළ යුතු වුවත් ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා සම්බන්ධ නොවන අමාත්‍යාංශ නිලධාරීන් ද පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරවා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු ය. | ඉටුකරන රාජකාරි මත ව්‍යාපෘති කාර්යමණ්ඩලය තෝරා ගත් අතර අනෙකුත් කාර්යමණ්ඩලය තේරීම අමාත්‍යාංශය විසින් සිදු කර ඇත. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අංක BD/GPS/155/08/03 හා 2019 මාර්තු 13 දිනැති ලිපියෙන් නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ලංකා බැංකුවේ මූල්‍ය කල්බදු පහසුකම් යටතේ කැබ් රථ 10ක් මිලදී ගැනීම අනුමත කර තිබුණු අතර කල්බදු පොලිය වැය විෂය 1406 යටතේ ගෙවීම් කිරීමටත් ප්‍රාග්ධන වාරිකය වැය විෂය 2108 යටතේ ගෙවීම් කිරීමටත් උපදෙස් දී තිබුණි. එහෙත් අදාළ වැය විෂයයක් සඳහා ප්‍රතිපාදන සලසාගෙන නොතිබුණි. ප්‍රධාන මූල්‍ය නිලධාරීගේ උපදෙස් අනුව ව්‍යාපෘතියේ මෙහෙයුම් වියදම යටතේ කල්බදු පොලිය රු.මිලියන 4.61ක් හා ප්‍රාග්ධන ගෙවීම රු.මිලියන 7.20 ක් සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි. | වැය විෂයය 1406 හා 2108 සඳහන් ප්‍රතිපාදන සලසාගෙන ඉදිරි ගෙවීම් කිරීමට කටයුතු කිරීම සුදුසු වේ. | ජාතික අයවැය දෙපාර්තමේන්තුව විමසා ඉදිරි කටයුතු කිරීමට උපදෙස් දෙන ලදී. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මෙහෙයුම් කාර්යයන් හා සංවර්ධන කාර්යයන් යටතේ පුනරාවර්තන වැය විෂයයන් 20 කට අදාළ මුළු ප්‍රතිපාදනය වන රු.මිලියන 1,256.52න් රු.මිලියන 1,064.96ක ප්‍රතිපාදන ඉතිරි වී තිබූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 84.75ක් විය. ඒ අනුව වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේදී මුදල් රෙගුලාසි 50 මගින් අවධාරණය කර ඇති කරුණු පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි. | ඇස්තමේන්තු සකස් කිරීමේදී තාත්ත්විකව පිළියෙල කිරීමට කළමනාකරණයේ අවධානය යොමු කරවමි. | අයවැය චක්‍රලේඛ 03/2019 හා 05/2019 ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවෙන් වෙන්කර තිබූ ප්‍රාග්ධන ප්‍රතිපාදනයන්ගෙන් සියයට 25ක් අනිවාර්යයයෙන් ඉතිරිකර ඇත. එමෙන්ම අයවැය චක්‍රලේඛ අංක 04/2019 හා 07/2019 අනුව මූල්‍ය විනය පවත්වාගැනීම හා නිසියාකාර වියදම් පාලන නිර්ණායක යෙදීමත් එම නිර්නායක මගින් වියදම් පාලනය කිරීමත් නිසා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉතිරියක් පෙන්නුම් කර ඇත. තව ද, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් අක්මුදල් අවශ්‍යතාවයට අනුව අක්මුදල් නිදහස් නොකිරීම නිසා පසුගිය වර්ෂයේ ඇති කරගත් බැදීම් හා බැරකම් නිසිපරිදි නිරවුල් කිරීමට නොහැකි වීම ද උක්ත ඉතිරියට සෘජුවම බලපා ඇත. |
| (ඇ) | මෙහෙයුම් කාර්යයන් හා සංවර්ධන කාර්යයන් යටතේ ප්‍රාග්ධන වැය විෂයයන් 16කට අදාළ මුළු ප්‍රතිපාදනය වන රු.මිලියන 5,181.96 ම මුළුමනින් ම ඉතිරි වී තිබුණි. | නියමිත පරිදි ප්‍රතිපාදන උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. | රාජ්‍ය අමාත්‍ය කාර්යාලයේ සිදුවූ සංශෝධන, අඩු පහසුකම් සහිත (නැගී එන) ප්‍රදේශවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියේ ගෙවීම් සඳහා බිල්පත් ඉදිරිපත් නොවීම, සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතියට අදාළව අක්මුදල් ඉල්ලීම් ඉදිරිපත් නොවීම, කොළඹ මහ නගර සභාව සඳහා අවශ්‍ය ගිනි නිවීමේ වාහන උපකරණ සැපයීම සහ පළාත් පාලන ආයතන සඳහා කසළ එකතු කිරීමේ කම්පැක්ටර් රථ සැපයීම යන ව්‍යාපෘතීන්හි ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීම, පොදු අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුදල් නොලැබීම, මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ප්‍රදාන ප්‍රමාද වීම, මඩකලපුව නගර සභාවේ මහජන පුස්තකාලය ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ වෙනත් දෙපාර්තමේන්තුවලට නිදහස් කළ ප්‍රතිපාදනයන් වැය නොකිරීම හා ග්‍රාමීය පාළම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ වියදම් ගිණුම්ගත කිරීම සඳහා සලසා තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම ආදී හේතූන් නිසා මෙම ප්‍රතිපාදන ඉතිරිය ඇති විය. |

| | | | |
|---|---|---|---|
| **(ඇ)** | මෙහෙයුම් කාර්යයන් හා සංවර්ධන කාර්යයන් යටතේ ප්‍රාග්ධන වැය විෂයයන් 42කට අදාළ මුළු ප්‍රතිපාදනය වන රු.මිලියන 8,937.45 ක් වූ අතර ඉන් රු.මිලියන 6,170.74ක් ඉතිරි වී තිබුණු අතර එය ප්‍රතිශතයක් වශයෙන් සියයට 69.04ක් විය. | නියමිත පරිදි ප්‍රතිපාදන උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු ය. | ඉහත “අ” සහ “ආ” මගින් ද විස්තර කළ පරිදි, බිල්පත් ඉදිරිපත් නොවීම්, අක්මුදල් නොලැබීම්, ප්‍රසම්පාදන කාර්යයන් ප්‍රමාද වීම්, වැනි හේතූන් මත මෙම ප්‍රතිපාදන ඉතිරි විය. |
| **(ඉ)** | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන මාරු කිරීම් රු.මිලියන 754.19 ක් ලෙස දක්වා තිබුණ ද වර්ෂයේ සත්‍ය ප්‍රාග්ධන මාරුකිරීම් රු.මිලියන 23.96 ක් විය. එම වියදම 155-1-2-2201 යටතේ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයට සිදු කළ මාරු කිරීම් වේ. ප්‍රාග්ධන මාරු කිරීම් නොවන මූලධන වියදම් ප්‍රාග්ධන මාරු කිරීම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | විධිමත් පරිදි ගිණුම්ගත කිරීම කළ යුතු ය. | ඒසීඒ 2 (i ) හි සටහන් අංක 12 හි වැය විෂය අංක 2202 සංවර්ධන සහායන් ලෙස ඇතුළත් වියදම් ප්‍රාග්ධන මාරුකිරීම් යටතේ ඇතුළත් කළ යුතු වේ. ඒ අනුව අදාළ වැය විෂය ඇතුළත් ව්‍යාපෘතීන්හි සියළුම වියදම් රු.මිලියන 754.19 ක් ප්‍රාග්ධන මාරුකිරීම් ලෙස ඇතුළත් කර ඇත. |
| **(ඊ)** | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 6 වන ඡේදයේ දක්වා ඇති පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිත කළ යුතු ආකෘති අංක ඒසීඒ 2 III මගින් ඉදිරිපත් කළ යුතු මූලික සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තු අතර විචලතාව පැහැදිලි කිරීම සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව නිවැරදිව මූල්‍ය ප්‍රකාශ සකස් කළ යුතු ය. | ප්‍රධාන කාර්යාල ගිණුම සමඟ උප කාර්යාලයන්හි ගිණුම් විගණනයට ඉදිරිපත් කළ අතර, ACA 2-iiiහි අදාළ විස්තර එම උපකාර්යාලයන්හි මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා ඇත. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී ස්වදේශ කටයුතු අංශය මුදල් රෙගුලාසි 216(අ) විධිවිධානවලට පටහැනිව ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා රු.මිලියන 166.63 ක් සම්බන්ධයෙන් බැරකම් සඳහා එකඟ වී තිබුණි. | මුදල් රෙගුලාසි 216 (අ) විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු ය. | මූල්‍ය රෙගුලාසි 94 (2) වගන්තිය අනුව වාර්ෂික පුනාවර්තන සැපයුම් සම්බන්ධයෙන් ඊළඟ මුදල් වර්ෂය තුළ බේරුම් කිරීමට සිදුවන බැරකම් සඳහා ගත වූ තුන් අවුරුද්ද තුළ ප්‍රතිපාදනය කරන ලද මුදල් ප්‍රමාණයේ සියයට 50කට නොවැඩි සීමාවක බැඳීම් ඇති කර ගැනීමට බලය ලබා දී ඇති බව දැනුම් දෙමි. |

**2.3** **තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව වර්ෂ දෙකට වැඩි තැන්පතු ආදායම් ගිණුමට බැර කළ යුතු නමුත් පළාත් සභා සහ පළාත් පාලන අංශය වර්ෂ දෙක ඉක්මවූ රු. මිලියන 23ක තැන්පතු සම්බන්ධව මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | කටයුතු කරමින් පවතී. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **දැක්ම හා මෙහෙවර**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අමාත්‍යාංශයෙන් ඉටුවිය යුතු කාර්යභාරය සිදුකිරීමෙන් පසු අපේක්ෂිත ප්‍රතිඵල ඇතුළත් වන පරිදි දැක්ම හා මෙහෙවර පිළියෙල කර නොතිබුණි. | අමාත්‍යාංශයෙන් ඉටුවිය යුතු කාර්යභාරය සිදුකිරීමෙන් පසු අපේක්ෂිත ප්‍රතිඵල ඇතුළත් වන පරිදි දැක්ම හා මෙහෙවර පිළියෙල කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |

**3.2** **අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

නාගරික කසළ භාවිතයෙන් කොම්පෝස්ට් නිෂ්පාදනයේ ඉදිරි පියවරක් ලෙස දිනකට කසළ ටොන් 50ක භාවිතයෙන් කොම්පෝස්ට් ටොන් 17ක නිෂ්පාදන ධාරිතාවක් සහිත ජපානයේ නිෂ්පාදිත කොම්පෝස්ට් යන්ත්‍ර 9ක් පළාත් මට්ටමෙන් ස්ථාපිත කිරීමට අංක අමප/17/1375/744/005–II/ටීබීආර් හා 2017 ජූලි මස 19 දින කැබිනට් මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබූ අතර ඒ අනුව 2017 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 935.69 ක වියදමෙන් කොම්පෝස්ට් නිෂ්පාදන යන්ත්‍ර 9ක් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියෙන් බැහැරව මිලදීගෙන තිබුණි. යන්ත්‍ර සවිකිරීම සඳහා වූ ගොඩනැගිලි ඉදිකිරීම් කොන්ත්‍රාත් 9ක් රු.මිලියන 733.26කට කොන්ත්‍රාත්කරුවන් 6 දෙනෙකු වෙත පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අංක CP/2017/04 කැබිනට් සංදේශය අනුව එක් යන්ත්‍රයක වාර්ෂික මූල්‍ය ලාභය රු.මිලියන 80ක් වන අතර දිනකට යන්ත්‍රයක කොම්පෝස්ට් නිෂ්පාදන ධාරිතාව ටොන් 17 කි. ලංකාපුර, දඹුල්ල හා කුරුණෑගල යන ස්ථානවල පිහිටි කොම්පෝස්ට් නිෂ්පාදන යන්ත්‍ර භාවිතයට ගැනීම ආරම්භ වුව ද සමාලෝචිත වර්ෂය තුළ කොම්පෝස්ට් නිෂ්පාදනයක් සිදු නොවීම හේතුවෙන් කිසිදු ආදායමක් ලැබීමට අසමත් වී තිබුණි. එසේ ම 2017 වර්ෂයේ මිලදී ගත් යන්ත්‍ර 09න් යන්ත්‍ර 06 ක් මෙතෙක් භාවිතයට ගැනීම ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. | ඉලක්කගත අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | බස්නාහිර හා ඌව පළාත්වල මෙම යන්ත්‍ර සවිකිරීම සඳහා අවශ්‍ය ඉඩම් නිරවුල් නොවීම හේතුවෙන් යන්ත්‍ර මිලදී ගැනීමෙන් වසරකට පසු එම යන්ත්‍ර දෙක ගාල්ල හා කාත්තන්කුඩි යන ප්‍රදේශවල සවිකිරීම සඳහා කොන්ත්‍රාත් දෙකක් පිරිනමා තිබුණු අතර එම ඉදිකිරීම් කටයුතු 2020 අගෝස්තු 31 දින වන විටත් අවසන් කිරීමට නොහැකි වී තිබුණි. | 2017 වර්ෂයේ මිලදී ගත් යන්ත්‍ර නිශ්කාර්යව පවතින බැවින් ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු ය. | මහජන විරෝධතා හේතුවෙන් මුලින් තෝරා ගත් ස්ථාන වෙනස් කිරීමට සිදු විය. |
| (ඇ) | වඩමාරච්චි, හම්බන්තොට, කෑගල්ල යන ස්ථානවල ගොඩනැගිලි ඉදිකිරීමේ ප්‍රගතිය ඉතා දුර්වල මට්ටමක පැවති අතර ගිවිසුම්ගත කාලය තුළ වැඩ අවසන් කිරීමට නොහැකිව තිබුණි. | 2017 වර්ෂයේ මිලදී ගත් යන්ත්‍ර නිශ්කාර්යව පවතින බැවින් ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු ය. | වඩමාරච්චි අංගනයේ වැඩ අවසන් අදියරේ පවතින අතර හම්බන්තොට නිෂ්පාදන කටයුතු 2020 ජූනි 25 දින ආරම්භ කරන ලදී. කෑගල්ල ඉදිකිරීම් කටයුතු අවසන්ව ඇත. |

**3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති 6ක් රු.මිලියන 121.8 ක් වියදම් දැරීමෙන් පසු ඉදිකිරීම් නිම නොකර අත්හැර දමා තිබුණි. | ව්‍යාපෘති නිමකර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. | ඉදිකිරීමට අවශ්‍ය පරීක්ෂණ කටයුතු අවසන් නොවීම, ප්‍රතිපාදන වෙන් නොවීම, ඉඩම් නිදහස් නොවීම හා මහජන විරෝධතා හේතුවෙන් අත්හැර දමා තිබුණි. |

**3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ අයවැය යෝජනා අනුව 2018 හා 2019 වර්ෂවල ක්‍රියාකාරී සැලසුම්වලට ශ්‍රී පාදස්ථානය, මඩු පල්ලිය හා කෝනේශ්වරම් කෝවිලේ වන්දනාකරුවන් සඳහා පහසුකම් මධ්‍යස්ථාන ඉදිකිරීම ඇතුළත්ව තිබුණි. කෝනේශ්වරම් පහසුකම් මධ්‍යස්ථානය ඉදිකිරීම පිළිබඳ උපදේශක සමාගම වන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම හැර සමාලෝචිත වර්ෂය තුළ ඉහත ව්‍යාපෘතිවල කිසිදු ප්‍රගතියක් අත්කර ගැනීමට සමත්ව නොතිබුණි. | රජයේ ප්‍රතිපත්තිය අනුව ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘති නියමිත දින වකවානු තුළ ක්‍රියාත්මක කරවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය. | අදහස් දක්වා නොමැත. |

**3.5 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ උපදෙස් පරිදි අභ්‍යන්තර කටයුතු, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු යන සියලු අංශ ඇතුළත් අමාත්‍යාංශය සඳහා වන කාර්යසාධන වාර්තාව සකස් කර නොතිබුණු අතර පළාත් සභා හා පළාත් පාලන අංශය විසින් සහ ස්වදේශ කටයුතු අංශය විසින් වෙන වෙන ම කාර්යසාධන වාර්තා දෙකක් සකස් කර ඉදිරිපත් කර තිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |

## 3.6 විදේශ ආධාර ව්‍යාපෘති

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතියේ පළාත් මාර්ග සංවර්ධන සංරචකය** | | |
| (i).2018 අගෝස්තු 15 දිනැති හා අංක අමප/18/1682/805/051 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ සුදුසු නිලධාරීන් ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලයට හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකවලට අනුයුක්ත කළ යුතු වුවත් ඊට පටහැනිව ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලයට අමාත්‍යාංශයේ සේවකයින් නොවන බාහිර පුද්ගලයන් බඳවාගෙන රු. මිලියන 9.65ක වැටුපක් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කළ යුතුය. නැතහොත් අමාත්‍ය මණ්ඩල තීරණය සංශෝධනය කර ගැනීම සඳහා කටයුතු කළ යුතු ය. | මුල් ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමේ ඇමුණුම් 3 හි පරිච්ඡේද 25 ව්‍යාපෘතියට සම්බන්ධ රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් ගෙවීම දේශීය අරමුදලින් ගෙවිය යුතු බව දක්වා ඇත. ඒ අනුව 2019 වාර්ෂික ඇස්තමේන්තුවෙන් රු. මිලියන 100 ක ප්‍රතිපාදන ව්‍යාපෘතිය වෙත වෙන් කිරීම සිදුකර ඇත. |
| (ii).2019 වසර අවසන් වන විට පළමු කොටසේ අදියර 2කට අදාළ මාර්ග ඉදිකිරීම් කොන්ත්‍රාත් 18ක් පිරිනමා අවසන් විය යුතු වුව ද 2019 වසර අවසන් වන විට කොන්ත්‍රාත් 7ක් පමණක් පිරිනමා තිබුණු අතර කොන්ත්‍රාත්කරුවන් සිව්දෙනෙකු වෙත ස්ථානගත වීමේ අත්තිකාරම් ගෙවා තිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට උපව්‍යාපෘති සම්බන්ධයෙන් කිසිදු භෞතික ප්‍රගතියක් වාර්තා නොවීය. | වගකිව යුතු පාර්ශ්වයන් සැලසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පළමු අදියර තුළ මාර්ග කොන්ත්‍රාත් 8ක් සඳහා ප්‍රසම්පාදන දැන්වීම් ලැබුණු පසු ඇගයීමට ලක් කර එයින් 7ක් සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කරන ලද අතර 8වන පැකේජය සඳහා වැඩිදුර කරුණු විමසා තිබූ බැවින් එම පැකේජය ප්‍රදානය කිරීම ප්‍රමාදයට හේතු විය. |
| **(ආ) ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය (RBP)** | | |
| (i) එක්සත් රාජධානිය, නෙදර්ලන්තය ආදී රටවල පෞද්ගලික බැංකුවලින් එකී රටවල අපනයනය සංවර්ධනය කිරීමේ ණය ලෙස ලබා දී ඇති ණය මුදල් භාවිතයෙන් ඉදිකෙරෙන පාලම් සඳහා ස්ථාන තෝරා ගැනීම පිළිබඳ විධිමත් ක්‍රමවේදයක් නොපැවතුණි. ව්‍යාපෘති කාර්යමණ්ඩලයක් පැවතිය ද ඒකාබද්ධිත විශාල ප්‍රමාණයේ කොන්ත්‍රාත් (Turn Key) ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය | විදේශීය පෞද්ගලික බැංකුවලින් ලබා ගත් ණය මුදලින් උපරිම ආර්ථික හා සමාජ දායකත්වයක් ලැබෙන පරිදි අදාළ ස්ථාන | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් සිට 2015 ජූලි දක්වා මෙම ව්‍යාපෘතියේ අදියර 2 හා 3හි පාලම් 1000න් 500කට වඩා වැඩි ප්‍රමාණයක් කොන්ත්‍රාත් සමාගම් සමඟ සිදු කර ඇති අතර මෙම අමාත්‍යාංශය යටතේ 2016 ජූනි සිට ව්‍යාපෘති කළමනාකරණ ඒකකයන් පිහිටුවා ඇත. පාලම් ඉදිකරන |

| | | |
|---|---|---|
| සම්බන්ධව ප්‍රමාණවත් දායකත්වයක් ලැබී නොතිබුණි. | තෝරා ගත යුතුය. | ස්ථාන තෝරා ගැනීමේදී වර්තමාන හා අනාගත ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහ පෞද්ගලික ඉඩම් පිළිබඳ පුරෝකථනය කර ස්ථාන තෝරා ගනු ලැබේ. පාලම් තෝරා ගැනීමේ ක්‍රමවේදය නැවත අධ්‍යයනය කර වඩාත් විධිමත් ක්‍රමවේදයක් යටතේ සිදු කිරීමට සටහන් කර ගතිමි. |
| (ii).ටෝකියෝහි ඩොයිෂ් බැංකුවෙන් (Deutsche Bank) ලබාගන්නා ලද ණය මුදලක් භාවිතයෙන් ක්‍රියාත්මක ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය II අදියර යටතේ වානේ පාලම් 537ක් සැලසුම් කිරීම, සැපයීම හා සවිකිරීම 2015 වර්ෂයේ ආරම්භ කර 2018 තුන්වන කාර්තුවේ අවසන් කිරීමට නියමිත විය. කිහිප අවස්ථාවකදී දින දීර්ඝ කරවාගෙන 2019 වර්ෂය තුළ අදාළ කාර්යයන් නිම කර තිබුණි. නමුත් ගිවිසුම්ගත වටිනාකම ස්ටර්ලින් පවුම් 100ක අගයෙන් යුතු මෙම කොන්ත්‍රාත්තුවෙන් ඉදි කළ යුතු නිශ්චිත පාලම් ප්‍රමාණය දැක්වෙන ක්‍රියාකාරී සැලැස්මක් විගණනයට ඉදිරිපත් නොවීය. | ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ජාතික මෙහෙයුම් කමිටුවේ අනුමැතිය ලබා ගත යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (iii).ගිවිසුම අනුව පාලම් සවිකළ යුතු ස්ථාන හඳුනාගැනීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් දියත් කර නොතිබුණු අතර පාලම් ස්ථානගත කළ යුතු ස්ථාන තීරණය කිරීමේදී පාලමක් සඳහා වන පිරිවැය හා එම පාලමෙන් ප්‍රයෝජන ගනු ලබන්නන් සංඛ්‍යාව හා අනාගතයේදී සිදුවිය හැකි වර්ධනයන් සලකා ප්‍රමාණවත් පිරිවැය ප්‍රතිලාභ විග්‍රහයකින් පසුව ස්ථාන තෝරා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේ ම වසර 100කට වැඩි කාලයක පැවැත්මක් අපේක්ෂාවෙන් සවිකරනු ලැබුව ද පාලමේ කොන්ක්‍රීට් ඉදිකිරීම පිළිබඳ කිසිදු ප්‍රමිති පාලන කටයුත්තක් සිදු කර නොතිබුණි. | අධික පිරිවැයකින් යුතු වානේ පාලම් වන බැවින් විධිමත් අධ්‍යයනයකින් ස්ථාන තෝරා ගැනීමේ ක්‍රියාවලියක් දියත් කළ යුතුය. | පාලම් ආනයනය කිරීම සහ ඒ සඳහා අදාළ ගෙවීම ඩොයිෂ් බැංකුව මගින් කරනු ලැබුවේ පාලම් ඉදිකිරීමට නිශ්චිත ස්ථානයක් හඳුනාගෙන එක්සත් රාජධානියේ එක්ස්පෝට් ක්‍රෙඩිට් ගැරන්ටි දෙපාර්තමේන්තුවෙන් (Export Credit Guarantee Department) ඒ සඳහා පාරිසරික අනුමැතිය ලබා ගත් පසුව ය. ඇගයීම සඳහා පූර්ව ශක්‍යතා ඇගයුම් ප්‍රශ්නාවලියක් හා ශක්‍යතා අධ්‍යයන වාර්තා ආකෘති සකස් කර පළාත් ඉංජිනේරුවරයන් වෙත යොමු කර ඇත. |

| | | |
|---|---|---|
| (iv)වානේ පාලමක අවශ්‍යතාවයක් නොමැතිව, ආයෝජනය කරන ලද මුදලට සාපේක්ෂව ප්‍රතිලාභයක් හිමි නොවන මෙන් ම බෝක්කු ඉදි කළ යුතු ස්ථානවල විශාල ප්‍රමාණයේ පාලම් ඉදිකර ඇති අවස්ථා නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. | විදේශීය පෞද්ගලික බැංකුවලින් ලබා ගත් ණය මුදලින් උපරිම ආර්ථික හා සමාජ දායකත්වයක් ලැබෙන පරිදි ස්ථානයක් තෝරා ගත යුතුය. | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඉදිකර ඇති පාලම් වේ. |
| **(ඇ) නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP)** | | |
| (i). ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය විසින් රු. මිලියන 20,622ක ආධාර සැපයීම යටතේ ක්‍රියාත්මක කරනු ලබන නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියේ පැකේජ 1 මගින් ග්‍රාමීය මාර්ග 224ක් හා කුඩා හා මධ්‍යම පරිමාණයේ වාරිමාර්ග 121ක් සංවර්ධනය කිරීමටත් පැකේජ 2 මගින් පානීය ජල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති 67ක් ක්‍රියාත්මක කිරීමටත් සැලසුම් කර තිබුණි. එහෙත් 2019 වර්ෂයේ එහි සඳහන් ඉලක්කයට අදාළ කාර්යභාරයන් ඉටු කිරීමට නොහැකිවී තිබීම මත කාර්ය සාධනයක් පෙන්වීමට නොහැකි වී තිබුණි. | අමාත්‍ය මණ්ඩලය නියම කර ඇති කාලපරිච්ඡේදය තුළ ව්‍යාපෘතිය අවසන් කිරීමට අදාළ පාර්ශ්ව වෙත බලපෑම් කළ යුතුය. | ව්‍යාපෘති සැලසුම් කිරීමේදී උපදේශක සේවාවන් ලබා ගැනීම සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කටයුතු අවසන් කිරීමට මාස 6 ක කාලයක් ලබා දී තිබුණ ද අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මගින් මෙම කටයුතු අවසන් කිරීමට මාස 42ක කාලයක් ගත කර තිබුණි. |
| (ii)ව්‍යාපෘති කළමනාකරණ කාර්යසංග්‍රහය (Project Memorandum) අනුව අභ්‍යන්තර විගණකවරයා විසින් ප්‍රසම්පාදන විගණනයක් සිදු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | උපදෙස් පරිදි ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලන දුර්වලතා හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු ය. | අභ්‍යන්තර විගණකවරයා වෙත උපදෙස් ලබා දී ඇත. |
| **(ඇ) ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය (PHSSP)** | | |
| (i) ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය සඳහා සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | කාර්යමණ්ඩලය විධිමත් ලෙස පත්කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමෙන් පසු | මෙම ව්‍යාපෘතිය සඳහා අනුමත කාර්යමණ්ඩලය පදනම්කොට පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් මෙම අමාත්‍යාංශයට අදාළ ඒකක |

| | | |
|---|---|---|
| විසින් ලබා දෙන ලද කාර්යමණ්ඩල අනුමැතිය පදනම් කරගෙන රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2019හි උපදෙස්වලට පටහැනිව තම අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිලධාරීන් දෙදෙනෙකු අර්ධකාලීන පදනමට ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය සඳහා පත් කර තිබුණි. | අමාත්‍යාංශය විසින් ම පත් කළ යුතු වේ. | සඳහා කාර්යමණ්ඩලය බඳවාගෙන ඇත. |
| (ii) ව්‍යාපෘති කළමනාකරණ කාර්යසංග්‍රහයේ 64 වගන්තිය අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබූ අතර මුදල් රෙගුලාසි 626 අනුව විදේශාධාර ව්‍යාපෘති සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට හැකිවන ද්විත්ව සටහන් ක්‍රමයට ගිණුම් පොත් පවත්වා ගැනීමට අවශ්‍ය උපදෙස් පළාත් සභා වෙත ලබා දී නොතිබූ අතර එසේ පොත් පවත්වාගෙන ගොස් ද නොතිබුණි. | මුදල් රෙගුලාසි 626 ප්‍රකාරව ගිණුම් පොත්පත් පවත්වා ගත යුතු අතර ව්‍යාපෘති කළමනාකරණ කාර්යසංග්‍රහයේ උපදෙස් අනුව මූල්‍ය ප්‍රකාශ සකස්කොට සෑම වසරක ම පෙබරවාරි 28 දිනට පෙර ඉදිරිපත් කළ යුතු ය. | මේ වන විට සියලු පළාත් සභා වෙත මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. |

| | | |
|---|---|---|
| **(ඉ) නාගරික ව්‍යාපෘති සඳහා මූලික පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය (UPPF)** | | |
| (i) ඉදිරියේ අනුමත කරගැනීමට අපේක්ෂා කරන ද්විතීය නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතිවල මූලික කාර්යයන් ඉටුකිරීම සඳහා තාක්ෂණික සහාය ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක නාගරික ව්‍යාපෘතීන් සඳහා ප්‍රාරම්භක පහසුකම සඳහා ඇ.එ.ජ. ඩොලර් මිලියන 05ක ණය මුදලක් ආසියානු සංවර්ධන බැංකුව විසින් අනුමත කර තිබුණි. එම ව්‍යාපෘතියේ අධ්‍යක්ෂවරයාට වැටුප් ගෙවීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 01/2019 හා 2019 මාර්තු 05 දිනැති චක්‍රලේඛයේ විධිවිධාන යටතේ පිහිටවිය යුතු වැටුප් තලයේ නොපිහිටුවා මාසයකට රු.60,000ක් වැඩියෙන් 2020 ජූනි මස වන විට රු. 600,000ක් වැඩිපුර ගෙවා තිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතු අතර වැඩිපුර ගෙවීම් අයකර ගැනිමට කටයුතු කළ යුතු ය. | වැටුප් ගෙවීම සම්බන්ධව තවදුරටත් පරීක්ෂා කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දි ඇත. |
| (ii) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 01/2019 හා 2019 මාර්තු 05 දිනැති චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව පුරනැගුම ව්‍යාපෘතියේ මූල්‍ය විශ්ලේෂකවරයා මෙම ව්‍යාපෘතියේ ගණකාධිකාරීවරයා ලෙස වැඩ බැලීමේ පදනම යටතේ පත්කර, වැටුප් ලෙස රු.405,000ක් ගෙවා තිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතු අතර වැඩිපුර ගෙවීම් අයකර ගැනිමට කටයුතු කළ යුතු ය. | ව්‍යාපෘතියේ දෛනික කටයුතු කරගෙන යාමට තාවකාලික පියවරක් ලෙස මෙම නිලධාරියා සේවයේ යොදවා ඇත. වැටුප් ගෙවීම පිළිබඳ තවදුරටත් පරීක්ෂා කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |
| (iii) මෙම ව්‍යාපෘතියේ කටයුතු සඳහා පුද්ගලික උපදේශක සමාගමක් තෝරාගෙන රු.මිලියන 50.11ක ස්ථානගත වීමේ අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණ ද වර්ෂය තුළ කිසිදු ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් නියමිත කාලය තුළ ඉටුකිරීම අදාළ පාර්ශ්ව වෙත බලපෑම් කළ යුතු ය. | 2019 වර්ෂය තුළ උපදේශක කාර්යාල මගින් උප ව්‍යාපෘති යෝජනා හඳුනා ගැනීමට සංවර්ධන යෝජනාවල අවශ්‍යතා තක්සේරු වාර්තා සකස් කරන ලදී. |
| **(ඊ) පුරනැගුම ව්‍යාපෘතිය (LGESP) යටතේ ඉදිකිරීම්** | | |
| (i) ප්‍රාදේශීය සභාවල එදිනෙදා කටයුතු කාර්යක්ෂමව ඉටු කර ගැනීමට, ක්‍රියාපටිපාටි සරල කිරීමට උපකාර කිරීම සහ ප්‍රාදේශීය සභා පුරවැසියන්ට හිතකර බවට පත් කිරීමේ අරමුණින් ආසියානු | විදේශීය ණය මුදල් භාවිතයෙන් සිදුකරන ව්‍යාපෘති බැවින් අපේක්ෂිත අරමුණු ළඟා | අදාළ ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් උනන්දුවක් නොදැක්වීම අභ්‍යන්තර හා බාහිර ස්ථාන මාරු, වෙනත් මෘදුකාංග භාවිතය, පුහුණු කාර්යමණ්ඩල ලවා නුපුහුණු නිලධාරීන් පුහුණු |

| | | |
|---|---|---|
| සංවර්ධන බැංකුවේ ණය මුදලකින් මූල්‍යයනය වන පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ (ආංශික) ව්‍යාපෘතිය යටතේ අඩු ආදායම්ලාභී ප්‍රාදේශීය සභා සඳහා සකස් කරන ලද පරිගණක මෘදුකාංග විසඳුමක් වන ඊ - පුරනැගුම මෘදුකාංගය පළාත් 07ක තෝරා ගත් ප්‍රාදේශීය සභා 137ක ස්ථාපනය කර තිබුණි. මධ්‍යම හා වයඹ පළාත් දෙකෙහි සිදුකරන ලද විගණනයේදී ප්‍රාදේශීය සභා 41න් ප්‍රාදේශීය සභා 16ක මෙම මෘදුකාංගය භාවිතා නොවන බව ද මෙම මෘදුකාංගය ක්‍රියාත්මක වූ කිසිම පළාත් පාලන ආයතනයක හඳුන්වා දී තිබූ මොඩියුලයන් සඳහා සැලසුම් කළ කාර්යයන් 4 න්ම අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී ඇති බව ද නිරීක්ෂණය විය. | කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය. | නොකිරීම. අමාත්‍යාංශයේ පළාත් පාලන අංශය පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය නොවීම |
| (ii)පුරනැගුම ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 332.19 ක වියදමෙන් ඉදිකරන ලද ප්‍රාදේශීය සභා 12කට භාරදී තිබූ ජල සම්පාදන ව්‍යාපෘති , ප්‍රවේශ මාර්ග, බෙදා හැරීමේ පද්ධති මාස 30 සිට මාස 57ක් නිශ්ක්‍රීයව පැවතුණු අතර රු.මිලියන 16.49 ක් වැය කර ඉදිකරන ලද හෙට්ටිපොළ ප්‍රාදේශීය සභාව වෙත භාර දෙන ලද ආදාහනාගාරයක් මාස 36කට වඩා නිශ්ක්‍රීයව පැවතුණි. | අපේක්ෂිත ආර්ථික හා සමාජයීය ප්‍රතිලාභ අත්පත් කර ගැනීම සඳහා වගකිව යුතු පාර්ශ්වයන් වෙත බලපෑම් කළ යුතු ය. | සොයා බලා ඉදිරි කටයුතු සිදු කිරීමට පළාත් ප්‍රධානීන් වෙත උපදෙස් ලබා දී ඇත. |
| (iii) රු.මිලියන 513.73ක වියදමෙන් ඉදිකරන ලද බහුකාර්ය ගොඩනැගිලි 12ක් ද, රු.මිලියන 18.90ක වියදමෙන් ඉදිකරන ලද පුස්තකාලයක් ද, රු.මිලියන 105.06ක වියදමෙන් ඉදිකරන ලද සතිපොළ 03ක් ද විවිධ හේතු මත ඌන උපයෝජිතව පැවතුණි. | ඉදිකිරීම්වලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීම සඳහා කටයුතු කළ යුතු ය. | රත්තොට සතිපොළ කඩකාමර ලෙස වෙන්කර කුලියට දීමට ලංසු කැඳවා ඇති අතර තිස්සමහාරාම මාළු වෙළෙඳපොළ පළතුරු තොග වෙළෙන්දෙකුට කුලියට දී ඇත. වළල්ලාවිට බහුකාර්ය ගොඩනැගිල්ල සම්බන්ධව පළාත් බලධාරීන් සමඟ තවදුරටත් සාකච්ඡා පවත්වන අතර අනෙකුත් ගොඩනැගිලි සම්බන්ධව අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |

| | | |
|---|---|---|
| (iv) මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් නිමකර ප්‍රාදේශීය සභා වෙත භාරදෙන ලද බස්නැවතුම්පොළ, බහුකාර්ය ගොඩනැගිලි, පානීය ජල ව්‍යාපෘති ඇතුළු උපව්‍යාපෘති 16කින් අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගැනීමට නොහැකි වී තිබුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා අවශය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් දෙන ලෙස හා නිරන්තරයෙන් පසුවිපරම් සිදුකරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |
| (v) මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද උඩපළාත ජල යෝජනා ක්‍රමයේ පවතින අඩුපාඩු හේතුවෙන් ප්‍රාදේශීය සභාව විසින් උප ව්‍යාපෘතිය භාර නොගැනීම නිසා අඩුපාඩු සකස් කිරීමට රු.මිලියන 9.3ක අතිරේක කොන්ත්‍රාත්තුවක් ලබා දී තිබුණි. එහෙත් කොන්ත්‍රාත්කරු විසින් අඩුපාඩු නිවැරදි කර නොතිබුණි. එහෙත් කොන්ත්‍රාත්කරු විසින් අඩුපාඩු නිවැරදි කර නොතිබුණු අතර කාර්යසාධන බැඳුම්කරය මුදල් කිරීමට තීරණය කර තිබුණ ද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන සංග්‍රහය හා කොන්ත්‍රාත් ගිවිසුම අනුව කටයුතු කළ යුතු ය. | කාර්යසාධන බැඳුම්කරය 2020 ඔක්තෝබර් 31 දින දක්වා දීර්ඝ කර ඇති අතර කොන්ත්‍රාත්තුවේ අඩුපාඩු පිළිබඳ සොයා බලා නිර්දේශ ඉදිරිපත් කිරීමට කමිටුවක් පත්කර ඇත. |
| (vi) ව්‍යාපෘතිය මුල් අදියරේදී රු.මිලියන 282.36ක වියදමෙන් ඉදිකරන ලද උඩ පළාත, උඩුදුම්බර හා විල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල ජල ව්‍යාපෘති 3ක අඩුපාඩු නිවැරදි කිරීම සඳහා පුරනැගුම දෙවන අදියරේදී රු.මිලියන 102ක කොන්ත්‍රාත්තුවක් ලබා දී තිබුණි. | මුලින් සිදු කරන ලද සැලසුම් නිර්මාණ ආශ්‍රිත ඉදිකිරීම්වල අඩුපාඩු හේතුවෙන් රජයට පාඩුවක් සිදු වී ඇතිනම් අදාළ නිලධාරීන්ට එරෙහිව ක්‍රියාකිරීමට හා පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |
| **(උ) ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (LDSP)** | | |
| (i) ණය ගිවිසුමේ 2වන උපලේඛනයේ D කොටසේ දක්වා ඇති ආකාරයට පළාත් පාලන ආයතනවල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත උපව්‍යාපෘති තෝරාගෙන නොතිබියදී මූලික ප්‍රදානයන් කිරීම සඳහා පළාත් සභා වෙත රු.මිලියන 268.98ක් 2019 දෙසැම්බර් 26 දින නිදහස් කර තිබුණි. | තෝරා ගත් උප ව්‍යාපෘති සඳහා කඩිනමින් අනුමැතිය ලබාදී ඉදිකිරීම් ආරම්භ කළ යුතුය. | අනුමැතිය ලැබීමෙන් පසු අක්මුදල් නිදහස් කර ඇත. |

| | | |
|---|---|---|
| (ii) 2017 නොවැම්බර් 20 දිනැති හා අංක 17/2708/706/129 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලෝක බැංකුව සමග අත්සන් කිරීමට නියමිත ණය ගිවිසුම් අත්සන් කරන තෙක් වැඩසටහන්ගත ව්‍යාපෘතිවල මූලික කටයුතු (Programmetic Project Preperation Facility – World Bank Funded Projects) ඉටුකිරීමට ඇ.එ.ජ. ඩොලර් මිලියන 3ක ව්‍යාපෘතියක් ජාතික ක්‍රම සම්පාදන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වූ අතර ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියේ මූලික කටයුතු වෙනුවෙන් ද ඇ.එ.ජ. ඩොලර් 500,000ක් වෙන්කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා ඇමතූ ලිපියක් මගින් උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ක්‍රියාත්මක කරනු ලබන මූලික කටයුතු සඳහා කාර්යමණ්ඩල අනුමැතියක් ඉල්ලා තිබූ අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් කාර්යමණ්ඩල අනුමැතියක් ලබා දී තිබුණ ද වැටුප් තලයන් අනුමත කර නොතිබුණි. අංක 01/2016, 01/2016(I) හා 01/2019 දරන චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ඩොලර් මිලියන 5ක ව්‍යාපෘති කාර්යයන් සාමාන්‍ය රාජකාරි යටතට අයත් විය යුතු විය. එහෙත් ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කළ 2018 සැප්තැම්බර් 01 දින සිට 2019 ජූනි 31 දක්වා නිලධාරීන් 06 දෙනෙකු සඳහා එකතුව රු.1,637,110ක් වූ වැටුපක් ගෙවා තිබුණු අතර ඉන් රු.1,107,228ක මුදලක් ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ගිණුම්ගත කර තිබුණි. | නීතිරීති රෙගුලාසිවලට පටහැනිව ගෙවන ලද වැටුප් ආපසු අය කිරීමට හා චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කිරිමට අදාළ නිලධාරීන් වෙත දැන්විය යුතු ය. | තනතුරු අනුමත කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද FR 71 ආකෘතියේ වැටුප් පරිමාණය සමස්ත ව්‍යාපෘතියේ වටිනාකමට අදාළ වන පරිදි නිර්දේශ කර යවා ඇති අතර ඒ අනුව වැටුප් ගෙවීම සිදු කර ඇත. ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර වැටුප් සඳහා වන වියදම ව්‍යාපෘතිය යටතේ ගිණුම්ගත කර ඇත්තේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශවලට එම දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදනවලින් ගෙවිය නොහැකි බැවිනි. |

**3.7 ප්‍රසම්පාදනයන්**

----------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) කම්පැක්ටර් රථ මිලදී ගැනීම** | | |
| (i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ජාතික ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් කම්පැක්ටර් රථ 100 ක් ප්‍රසම්පාදනය කර පළාත් පාලන ආයතන වෙත බෙදා හැරීම සඳහා 2017 අගෝස්තු 14 දින ජාතික පුවත්පත්වල අදාළ ප්‍රසම්පාදන දැන්වීම පළ කර තිබූ අතර එහි 4වන ඡේදයෙහි "මෙම ප්‍රසම්පාදනය ශ්‍රී ලංකාවේ ලංසුකරුවන්ට විවෘත ය. හවුල් ව්‍යාපාරවලට ද අයදුම් කළ හැක." යනුවෙන් ශ්‍රී ලංකා ලංසුකරුවන්ට පමණක් සීමාකර තිබුණි. එහෙත් දේශීය නියෝජිත ආයතනයක් පවා නොමැතිව විදේශ ගමන් බලපත්‍රය සමඟ ඉදිරිපත් වූ චීන ජාතිකයෙකු වෙත ලංසුපත් නිකුත් කර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ පළමු පරිච්ඡේදයේ සඳහන් අරමුණු කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ii). ලංසු ලේඛනයේ පළමුවන කොටසේ ලංසුකරුවන් සඳහා ලබා දී ඇති උපදෙස් අංක 4.4 වගන්තිය අනුව ලංසු තොරතුරු ලේඛනයේ දක්වා ඇතිනම් පමණක් විදේශීය ලංසුකරුවන්ට ලංසු ඉදිරිපත් කළ හැකි ය. එහෙත් ලංසු තොරතුරු ලේඛනයේ විදේශීය ලංසුකරුවන් පිළිබඳ සඳහන් නොවී තිබියදී විදේශීය ලංසුකරුවෙකු වෙත ලංසු ලේඛන ඉදිරිපත් කර තිබූ අතර ප්‍රසම්පාදන මණ්ඩලය විසින් ලංසු ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුව කටයුතු කළ යුතු ය. | අදහස් දක්වා නොමැත. |
| (iii). ලංසු ඉදිරිපත් කළ ලංසුකරුවන් 14 දෙනාගෙන් 04 දෙනෙකු ම කැබිනට් මණ්ඩලය පත් කළ ප්‍රසම්පාදන මණ්ඩලය ගත් තීරණයට එරෙහිව අභියාචනා මණ්ඩලය වෙත අභියාචනා ඉදිරිපත් කර තිබුණි. විදේශීය ලංසු කරුවෙකු වීම හේතුවෙන් ලංසුව ප්‍රතික්ෂේප කිරීමට හැකියාව තිබියදී එක්ස්ඉසඩ්වයි හොංකොං (XZY Hong Kong) සමාගම අභියාචන මණ්ඩලය අභියාචනයෙන් ඉදිරිපත් කළ කරුණු ගැන පමණක් සලකා ලංසුවට අදාළ සැපයීම් කොන්ත්‍රාත්තුව පිළිගෙන තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුව කටයුතු කළ යුතු ය. | අදහස් දක්වා නොමැත. |

| | | |
|---|---|---|
| (iv).තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත ප්‍රසම්පාදන මණ්ඩලය විසින් තාක්ෂණික හා මූල්‍ය පළපුරුද්ද තහවුරු නොවීම හේතු කරගෙන ලංසුව ප්‍රතික්ෂේප කළ බව ලංසුකරු වෙත දන්වා තිබූ අතර එහිදී දේශීය නියෝජිතයෙකු රහිතව විදේශීය සමාගමට ලංසු ඉදිරිපත් කිරීමේ නොහැකියාව පිළිබඳ සටහන් කර නොතිබුණි. ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව මෙන් ම ප්‍රසම්පාදන මණ්ඩලය ද ලංසුකරුගේ මූලික අඩුපාඩුව මඟහැර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ පළමු පරිච්ඡේදයේ සඳහන් අරමුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. | අදහස් දක්වා නොමැත. |
| (v).අඩුපාඩු සහිතව ඉදිරිපත් වූ විදේශීය සමාගමේ ලංසුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ ඇගයීමට ලක්ව නොමැති බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් වාහන මිල ගණන් තීරණය වීමට හේතු වන නිෂ්පාදිත රට, තාක්ෂණික අංග, කල්පැවැත්ම, සේවාවන් හා අමතර කොටස් ලබා ගැනීමේ හැකියාව, ශක්තිමත් බව, භාවිත කරන්නන්ගේ ආරක්ෂාව හා වාහන සම්බන්ධයෙන් ඇති කීර්ති නාමය මෙන් ම සුන්බුන් අගය කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ පළමු පරිච්ඡේදයේ සඳහන් අරමුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. | අදහස් දක්වා නොමැත. |
| (ආ) **වත්කම් කළමනාකරණය සඳහා පරිගණක මෘදුකාංගයක් ස්ථාපිත කිරීම** | | |
| (i) අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන මණ්ඩලය විසින් වත්කම් කළමනාකරණය සඳහා පරිගණක මෘදුකාංගයක් සපයා ගැනීම සම්බන්ධයෙන් වන කොන්ත්‍රාත්තුව පිළිබඳ දැන්වීම ආසියානු සංවර්ධන බැංකු වෙබ් අඩවියේ පළ කිරීමටත්, මෙම කොන්ත්‍රාත්තුව සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ අනුමැතිය ලබා ගැනීමේ බලය ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත පැවරීමටත්, ගුණාත්මකභාවය හා පිරිවැය පදනම (CQS) මත කොන්ත්‍රාත්තුව පැවරීමටත් තීරණය කර තිබුණි. එමෙන් ම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.10 ඡේදය අනුව හා ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රසම්පාදන සංග්‍රහයේ 2.8 ඡේදයේ උපදෙස් අනුව ජාතික පුවත්පත්වල ප්‍රසම්පාදන දැන්වීම ප්‍රසිද්ධ නොකිරීම හේතුවෙන් කිසිදු දේශීය ලංසුකරුවෙකුට මේ සඳහා ඉදිරිපත් වීමේ හැකියාව ලැබී නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන මෙන් ම ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රසම්පාදන උපදෙස්වලට ද අනුකූලව ප්‍රසම්පාදනයන් කළ යුතු ය. | මෙම උපදේශක ආයතනය පත්කිරීම ආසියානු සංවර්ධන බැංකු ප්‍රසම්පාදන නීති රීති යටතේ සිදුකර ඇත. මෙය විදේශාධාර ව්‍යාපෘතියක් වන බැවින් ණයදෙන ආයතනයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතුවේ. ඒ අනුව කිසිදු විටක ක්‍රියාවලියෙන් බැහැරව ගොස් නැත. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2018 නොවැම්බර් 14 දින රැස් වූ ප්‍රසම්පාදන මණ්ඩලය ඇමෙරිකානු ඩොලර් 179,983.50 (රු.මිලියන 32.30)කට ඕස්ට්‍රේලියානු සමාගමකට මෙම කොන්ත්‍රාත්තුව ලබාදීමට තීරණය කර තිබුණි. ආයතනයකට පරිගණක මෘදුකාංගයක් (තොරතුරු තාක්ෂණ විසඳුමක්) හඳුන්වාදීමේදී එම මෘදුකාංගය සංවර්ධන කිරීම, ස්ථාපිත කිරීම, පුහුණු කිරීම මෙන් ම සහය හා නඩත්තු සේවය ලබා ගැනීම අත්‍යවශ්‍ය වුවත් මෙම කොන්ත්‍රාත්තුවේදී සහාය හා නඩත්තු සේවය පිළිබඳ සලකා බලා නොතිබුණි. | ආයෝජනය කරනු ලබන මුදලෙන් උපරිම ප්‍රතිලාභයක් ලැබෙන ලෙස කටයුතු කළ යුතුය. | මෙම කොන්ත්‍රාත්තුව අනුව මෘදුකාංගයක් නිර්මාණය කිරීම, ස්ථාපනය කිරීම හා පුහුණුව ඔවුන්ට පවරා ඇත. නඩත්තුව පිළිබඳව කොන්ත්‍රාත්තුවට ඇතුළත් කර නොමැත්තේ කාලය හා අමතර මුදල සලකා බලාය. එහෙත් ක්‍රියාත්මක කිරීමෙන් පසු යම් යම් ගැටළුවක් වෙතොත් ඒ සඳහා සහායවීමට ඔවුන් එකඟ වී ඇත. |
| (iii) | මෘදුකාංගය සංවර්ධන කිරීම, ස්ථාපිත කිරීම, පුහුණු කිරීම ආදී කාර්යයන් සඳහා ගුණාත්මකභාවය හා පිරිවැය පදනමට උපදේශක ආයතනයක් තෝරා ගැනීම නිවැරදි නොවන බව නිරීක්ෂණය විය | විගණනයට පිළිතුරු ලබාදීමේදී නිශ්චිත සාක්ෂි සමඟ පිළිතුරු ඉදිරිපත් කළ යුතුය. | ආසියානු සංවර්ධන බැංකු ප්‍රසම්පාදන කාර්යසංග්‍රහය අනුව මෙවැනි කර්තව්‍යයන් සඳහා ඉතාම සුදුසු වන්නේ CQS ක්‍රමවේදයයි. තවද මෙම ක්‍රමවේදය අනුගමනය කිරීමට අමාත්‍යාංශය ආසියානු සංවර්ධන බැංකුවෙන් ඉල්ලා නොසිටි අතර මෙය අනුගමනය කරන ලෙස උපදෙස් ලබා දුන්නේ ආසියානු සංවර්ධන බැංකුවයි. |
| (iv) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය විසින් 2012 වර්ෂයේ සිට පළාත් පාලන ආයතනවල ක්‍රියාත්මක කරමින් පවතින පරිගණක පද්ධතියේ ආධාරක හා නඩත්තු සේවා සැපයීම - 2018 සඳහා ගිවිසුමක් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අත්සන් තබා තිබුණි. එම පද්ධතියේ II අදියරේදී වත්කම් කළමනාකරණ විෂය වැඩසටහනට ඇතුළත්ව තිබියදී ප්‍රාදේශීය සභා 07ක මෙවැනි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට උපදේශක සමාගමක් ලෙස කොන්ත්‍රාත්කරුවෙකු පත් කර ගැනීමට ක්‍රියා කර තිබුණි. | තොරතුරු අධ්‍යයනය කර විධිමත්ව ක්‍රියා කළ යුතුය. | පළාත් පාලන පද්ධතිය සඳහා පිළියෙළ කරන ලද ගිවිසුම අනුව වත්කම් කළමනාකරණ විෂයය ආවරණය නොවන බව |

| | | |
|---|---|---|
| (v) 2011 වර්ෂයේ ආරම්භ කළ පුරනැගුම ව්‍යාපෘතිය 2020 ජුනි මාසයේදී අවසන් වීමට නියමිතව තිබියදී ව්‍යාපෘතිය ආරම්භක කාලයේ ක්‍රියාත්මක කළ යුතුව තිබූ නියමු ව්‍යාපෘතියක් 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණි. | නිශ්කාර්ය වියදමක් නොවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කවරේද යන්න පැහැදිලිව දැක්විය යුතුය. | 2012 වර්ෂයේ සිට ICTA ආයතනය හා ආසියානු සංවර්ධන බැංකුව විසින් පත්කළ උපදේශක සමාගම සමඟ අමාත්‍යාංශය මෙම විෂය සම්බන්ධයෙන් කටයුතු කර ඇතත් සාර්ථක මෘදුකාංගයක් වත්කම් කළමනාකරණය සඳහා නිර්මාණය කිරීමට නොහැකිවී ඇත. එහෙත් වරිපනම්, ගිණුම් ආදී අනෙකුත් ක්ෂේත්‍ර පරිගණක මෘදුකාංගය මඟින් මේ වන විට ආවරණය කර ඇත. ව්‍යාපෘති කාල සීමාව තුළ, නියමු ව්‍යාපෘතියක් ලෙස ප්‍රාදේශීය සභා 07ක මෙම වත්කම් කළමනාකරණ මෘදුකාංගය ද නිමකළ පසු අනෙකුත් ප්‍රාදේශීය සභා සඳහා මෙම මෘදුකාංගය ස්ථාපනය කිරීම අමාත්‍යාංශය මඟින් සිදුකළ හැකිවේ. ව්‍යාපෘති වලින් සිදුකරන සියලු කටයුතු අවසානයේ හා ඒවා අමාත්‍යාංශයේ විෂය පථය තුළ ක්‍රියාත්මක වන බැවින් මෙයද අමාත්‍යාංශයේ කාර්යභාරයට ඇතුළත් වේ. |

(ඇ) ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා නව ශ්‍රවණාගාරයක් දින 720 කින් ඉදි කිරීම සඳහා ඉදිකිරීම් සමාගමක් සමඟ රු. මිලියන 2,656ක් වටිනා කොන්ත්‍රාත්තුවකට ගිවිසුම්ගතව තිබුණු අතර එහි ප්‍රසම්පාදනය පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (i) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයට රු. 1,178,386 ක් ගෙවා පාංශු පරීක්ෂණ වාර්තාවක් 2018 වර්ෂයේ දී ලබා ගෙන තිබුණි. එසේ වුව ද, භූමියේ තත්ත්වය දුර්වල වීම හා ප්‍රසම්පාදන අදියරේ පිරිවැය ඇස්තමේන්තුවේ ටැඹ වැඩ **(Pilling work),** කොන්ක්‍රීට් වැඩ, ඉඩම් පළල් කිරීම් වැඩ ඇතුළත් නොවුණි. එම හේතුවෙන් භූමියේ තාවකාලික වැය **(Provisional Sum)** සඳහා වෙන් කර තිබූ රු. මිලියන 150 ක් ප්‍රමාණවත් නොවන බැවින් අතිරේකව තවත් රු. මිලියන 498 ක් වෙන් කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතු ය. | ඉදිකිරීම් භූමිය දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීමේදී ඉවත් කරන ලද පස් හා ගල් යොදා පුරවා ඇත. එබැවින්, ලංසු ලියවිලි නිකුත් කිරීමේදී භූමියේ තත්වය සම්බන්ධව ලංසුකරුවන්හට ලංසු ඉදිරිපත් කිරීම සඳහා පමණක් කටයුතු කරමින් ස්ථාන කිහිපයක් තෝරාගනිමින් මූලික පාංශු පරීක්ෂාව සිදු කරන ලදි. කොන්ත්‍රාත්කරු වැඩ බිම භාර ගැනීමෙන් පසුව භූමිය සම්බන්ධව විශ්වසනීයවූත් නිවැරදිවූත් තත්ත්වය සම්බන්ධව අවබෝධ කර ගැනීමට මූලික පාංශු පරීක්ෂාවෙන් පමණක් ප්‍රමාණවත් |

| | | |
|---|---|---|
| | | නොවන බැවින්, කොන්ත්‍රාත්කරු විසින් වෙනම පාංශු පරීක්ෂාවක් සිදු කල යුතු බව දන්වා ඇත. ඒ අනුව, මුළු භූමියම පාංශු පරීක්ෂාවට ලක් කර ඇත. එහිදී මුලින් හඳුනාගත් තත්ත්වයට වඩා වෙනස්කම් රාශියක් ඇති බවට තහවුරු වී ඇත. මෙම ඉදිකිරීම සැලසුම් කර ඉදිකිරීමක් **(Design & Build)** වන අතර, ගොඩකරන ලද ඉඩමක් වන බැවිනුත් මුලින් වෙන් කරන ලද තාවකාලික වෙන් කිරීම ප්‍රමාණවත් නොවන බව තහවුරු වීම නිසා අතිරේක ප්‍රතිපාදන රු.මිලියන 498 ක් අවශ්‍ය වන බවට ඇස්තමේන්තු සකස් කිරීමට සිදු විය. |
| (ii) කොන්ත්‍රාත්තුව ආරම්භ කිරීමේදී ඇස්තමේන්තු කළ පිරිවැය රු. මිලියන 1700 ක් වුව ද, ක්‍රොන්තාත්තුව පිරිනමා තිබුණේ රු. මිලියන 2,658.9ක් විය. එය සියයට 56ක වැඩිවීමකි. මෙසේ මූලිකව එකඟ වූ විෂයපථය විටින් විට වෙනස් කිරීම හා පිරිවැය ඉහල දැමීම මඟින් පූර්ව ප්‍රසම්පාදන කටයුතු සාර්ථකව සිදු කර නොතිබුණි | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතු ය. | මූලික විෂය පථය වෙනස් වීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසෙහි පවතින අස්ථාවර බවය. අත්තිවාරම් පාදම සඳහා තාවකාලික වෙන් කරන ලද මුදල ප්‍රමාණවත් නොවූයේ පසුව කරන ලද පාංශු පරීක්ෂාවෙන් පසුවය. මෙම කොන්ත්‍රාත්තුව සැලසුම් කර ඉදිකිරීමේ **(Design & Build)** ක්‍රමවේදය මත සිදු කරන බැවින් සවිස්තරාත්මක පාංශු පරීක්ෂාවක් කිරීම කොන්ත්‍රාත්කරුට පැවරීමෙන් අත්තිවාරම සැලසුම් කිරීමේදී ඇති සම්පූර්ණ වගකීම ඔහුට පැවරීම සාමාන්‍ය ක්‍රමවේදය වේ. එසේ නොමැතිව එවැනි සවිස්තරාත්මක පාංශු පරීක්ෂාවක් අමාත්‍යාංශය මඟින් සිදු කලේ නම් ඉහත එම පරීක්ෂණයේ දත්ත පිළිබඳ සම්පූර්ණ වගකීම රජයට පැවරේ.<br><br>කුමන ආයතනයකට කොන්ත්‍රාත්තුව ප්‍රධානය කලද භූමියේ අස්ථාවරභාවය නිසා ටැඹ ඉදිකිරීම **(pilling)** සිදුවන අතර , මේ සඳහා වන වියදම් මුලින් දී ඇති තාවකාලිකව වෙන් කරන ලද මුදල ප්‍රමාණවත් නොවේ. අමාත්‍ය |

| | | |
|---|---|---|
| | | මණ්ඩලයේ අනුමැතිය ඇතිව මෙම මුදල රු.මිලියන 498 කින් වැඩි කරන ලද්දේ එබැවිනි. එසේ වුවද, කොන්ත්‍රාත්කරුට ගෙවීම් කරනු ලබනුයේ කරන වැඩ ප්‍රමාණය මැනීමෙන් පසුව විනා අනුමත වූ මුළු මුදල නොවන බව. |
| (iii) ජාතික තරඟකාරී ලංසු ක්‍රියාවලිය යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදු කර තිබූ අතර මූලිකවම දින **45**ක කාලයක් ලංසු කාල සීමාව ලෙස ලබා දී තිබුණ ද එම කාලසීමාව වරින් වර දීර්ඝ කිරීම නිසා අතිරේක අවස්ථා දෙකකදි පුවත්පත් දැන්වීම් පල කිරීමට රු.224,250 ක මුදලක් අතිරේකව දැරීමට සිදුව තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතු ය. | රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ යොමුව 5:3:2 යටතේ දක්වා ඇත්තේ 'ප්‍රසම්පාදන දැන්වීම් පළ කිරීම අධික වියදම් සහිත වුව ද එය පුළුල් තරඟකාරීත්වය මගින් අත් කර ගනු ලබන අරපිරිමැස්ම මගින් මකා දැමෙනු ඇත' යනුවෙනි. තව ද, එලෙස දැන්වීම් පළ කිරීම මගින් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවය සහ සමානාත්මතාවය යන්න ද තෘප්ත කරන බව. |
| (iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 වගන්තිය අනුව ලංසු විවෘත කිරීමේ වගකීම ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර ප්‍රසම්පාදන කමිටුවට එම අධිකාරිය, ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරන ලද සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත ලංසු විවෘත කිරීමේ කමිටුවට පැවරිය හැක. එසේ වුව ද, අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය මත පමණක් කමිටුව පත් කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතු ය. | ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයකු වන අමාත්‍යාංශයේ ලේකම්ගේ පූර්ව අනුමැතිය මගින් එකී ලංසු විවෘත කිරීමේ කමිටුව පත් කර ඇත. |

## 3.8 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නැඟී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා මූල්‍ය කල්බදු පදනමට කැබ් රථ 10ක් ලබා ගැනීමෙන් අනතුරුව ව්‍යාපෘතියේ භාවිතය සඳහා අමාත්‍යාංශය ලබා දී තිබූ කැබ් රථයක් හා මෝටර් රථයක් නිශ්කාර්යව පැවති අතර නැවත අමාත්‍යාංශයට ගෙන්වා ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | නිශ්කාර්යව පවතින වාහන ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |

## 3.9 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව ප්‍රසම්පාදන තීරණයක් ගෙන මුදල් රෙගුලාසි 137 (1), (2), (3), (4) හා 138හි විධිවිධාන පිළිබඳ සැලකිල්ලක් නොදක්වා "ඊ - පළාත් පාලනය" පරිගණක පද්ධතියේ සහායක හා නඩත්තු සේවා සඳහා පුද්ගලික සමාගමකට රු.මිලියන 9.6ක් ගෙවා තිබුණු අතර 2019 වර්ෂය ආරම්භ වන විටත් අකර්මණ්‍ය වී තිබූ ඊ පළාත් පාලනය පරිගණක පද්ධතිය සඳහා සහායක හා නඩත්තු සේවාවන් සපයා නොතිබුණි. | වියදම් අනුමත කිරීමේදී හා සහතික කිරීමේදී සිදු කර ඇති නොසැලකිල්ල සම්බන්ධව විධිමත් පරිදි ක්‍රියා කිරීම යෝග්‍ය වේ. | මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් වූ අමාත්‍ය මණ්ඩල තීරණය, තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ නියෝජිතායතනය (ICTA) විසින් ලබාදී ඇති නිර්දේශ හා අනෙකුත් කරුණු සැලකිල්ලට ගෙන අදාළ ගෙවීම් සිදුකර ඇත. |

## 3.10 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2017 වර්ෂයේ පරීක්ෂණ ආරම්භ කර ඇති වාහන අනතුරු 22ක් 2018 වර්ෂයේ සිදුවූ වාහන අනතුරු 6ක් හා 2019 වර්ෂයේ සිදු වූ වාහන අනතුරු 10 ක් ද සම්බන්ධව තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල සටහන් II යටතේ මුදල් රෙගුලාසි 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් ප්‍රකාශයෙහි දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු ය. | නිරීක්ෂණ හා එකඟ වේ.<br><br>2016 හා 2017 වර්ෂවල සිදුවූ අනතුරු සම්බන්ධ කටයුතු 2018 වර්ෂයේ දි අවසන් කර ඇති බැවින් එම අනතුරු 2019 වර්ෂයට ඇතුළත් නොවේ.2019 පොත්වලින් කපා හැරීමේ ප්‍රකාශයේ අතපසුවීමකින් ඇතුළත් වූ තොරතුරු 2020 වර්ෂය සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශවල නිවැරදිව ඉදිරිපත් කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වාහන අනතුරු 8ක් සම්බන්ධයෙන් සිදුවූ අලාභයේ තක්සේරු වටිනාකම නොසලකා ඉන්පසු අලුත්වැඩියා කළ මුදල හා අයකර ගත් මුදල අතර වටිනාකම අලාභය ලෙස හඳුනාගෙන ඇති අතර තක්සේරු කළ වටිනාකමේ හා අලුත්වැඩියා කළ මුදල අතර රු.1,934,099ක වෙනස්කම් නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු ය. | වාහනයක් අනතුරට ලක් වූ අවස්ථාවක රථයට බාහිරින් පමණක් අලාභ සිදු වූ විට බාහිරින් පරීක්ෂා කර බලා නිශ්චිත තක්සේරු වටිනාකමක් ලබා දිය හැකි වේ. එවැනි හානි අලුත්වැඩියා කිරීමේ දී අලුත්වැඩියා වියදම හා තක්සේරු වටිනාකම බොහෝ විට සමාන වේ. අභ්‍යන්තර හානි සිදුවී ඇති අවස්ථාවක නිශ්චිතව තක්සේරු වටිනාකමක් ලබා දිය නොහැකි බැවින් අලුත්වැඩියා වියදම මුල් ඇස්තමේන්තුවට සාපේක්ෂව විශාල වශයෙන් අඩුවන අවස්ථා පවතී. |

**3.11 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ද්විතීය නගර සංවර්ධන ව්‍යාපෘතිය තාක්ෂණික සහාය ලබා ගැනීම සඳහා ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 05 ක ණය මුදලක් ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබා ගැනීම සඳහා යෝජනාවක් සහිත කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබුණි.මෙම ව්‍යාපෘතියේ තනතුරු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවමින් 2019 මාර්තු 10 දින රු. 690,000 ක වියදමෙන් භාෂාත්‍රයෙන්ම පුවත්පත් දැන්වීමක් පළ කර තිබුණ ද මෙම දැන්වීමට කැඳවූ අයදුම්පත්වලින් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා පමණක් බඳවාගෙන තිබූ බැවින් පුවත්පත් දැන්වීම පළ කිරීම සඳහා දරන ලද රු. 690,000 ක වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | රජයට පාඩුවක් සිදුවී ඇත්දැයි සොයා බලා ඉදිරි කටයුතු කළ යුතු ය. | අදහස් දක්වා නොමැත. |

## 3.12 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව හා ජපන් සහයෝගීතා මූල්‍ය ආයතනයේ මූල්‍යායනය සහිතව මෙන් ම විදේශීය පෞද්ගලික බැංකුවලින් ලබාගත් ණය භාවිතයෙන් ද ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘති 15ක් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පවතී. මෙම ව්‍යාපෘතිවලින් 2ක් සඳහා පමණක් අභ්‍යන්තර විගණකවරු බඳවාගෙන තිබුණි. අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවල අභ්‍යන්තර විගණන කටයුතු සඳහා අභ්‍යන්තර විගණක තනතුරු 2ක් සඳහා අනුමැතිය ලබා දී තිබුණ ද ඉන් එක් තනතුරක් සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු නොවන බව නිරීක්ෂණය වූ අතර කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් ඇමතූ අංක DMA/IA/2017/Project Audit Circuler හා 2018 ඔක්තෝබර් 26 දිනැති ලිපියේ උපදෙස් පරිදි විදේශීය මූල්‍යායනය සහිත ව්‍යාපෘතිවල අභ්‍යන්තර විගණනය සිදුකිරීමට කටයුතු කර නොතිබුණි. | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් පරිදි ව්‍යාපෘති අභ්‍යන්තර විගණන කටයුතු ප්‍රතිසංවිධානය කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | අංක 01/2019 හා 2019 මාර්තු 05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 09වන ඡේදය අනුව විදේශීය මූල්‍යායන ව්‍යාපෘති සඳහා මාස දෙකකට වරක් බැගින් වර්ෂයකට ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් 6ක් පැවැත්විය යුතු වුවත් 2019 වර්ෂය තුළ එක් එක් ව්‍යාපෘතිය සඳහා රැස්වීම් 2 බැගින් පමණක් පවත්වා තිබුණි. ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම්වලදී ව්‍යාපෘති වැඩ සැලසුම්, ව්‍යාපෘති අයවැය, ක්‍රියාකාරී සැලසුම් අනුමත කිරීම සිදුකර නොතිබුණු අතර විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව ව්‍යාපෘති සම්බන්ධව සාකච්ඡා කර තීරණගෙන නොතිබුණි. මෙම ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම්වල වාර්තා කිරීම ද අදාළ ව්‍යාපෘතියේ අධ්‍යක්ෂවරයා විසින් ම සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි ජාතික මෙහෙයුම් කමිටුව ක්‍රියාත්මක විය යුතුය. | අදහස් දක්වා නොමැත. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ඩීඑම්එස්/සී /17/වෙළුම iv 2014 පෙබරවාරි 26 දිනැති ලිපියෙන් මෙම අමාත්‍යාංශය යටතේ ව්‍යාපෘති අංශයට කාර්යමණ්ඩලය අනුමත කර තිබූ අතර මෙම ව්‍යාපෘති අවසාන වීමත් කාර්යමණ්ඩලයට දීමනා අහෝසි වී යා යුතු බව දක්වා තිබුණ ද ඒ අනුව කටයුතු කර තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව කටයුතු කළ යුතුය | ව්‍යාපෘති අංශය සඳහා රජයේ නිලධාරීන් මෙන්ම කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් ද අනුයුක්ත කර ඇති අතර ව්‍යාපෘති අංශයේ කාර්යභාරය අවසන් වුවහොත් රජයේ නිලධාරීන් මාරු කිරීම ද කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් නිලධාරීන් ගේ සේවා කාලය අවුරුදු තුනකින් අවසන් කිරීම ද සිදු කෙරේ. |
| (ආ) | මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති අංශයේ සේවය සඳහා බඳවාගෙන සේවයෙහි නියුක්ත කරවා ඇති ප්‍රසම්පාදන විශේෂඥවරයාගෙන් හා ඉංජිනේරු උපදේශක (වාරිමාර්ග)ගෙන් ව්‍යාපෘති කාර්යක්ෂම කිරීමට හෝ ගැටලු නිරාකරණය කිරීමට අදාළව සමාලෝචිත වර්ෂය තුළ කිසිදු දායකත්වයක් ලැබී නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. | කාර්යමණ්ඩලය සංශෝධනය කර අත්‍යාවශ්‍ය රාජකාරි සඳහා පමණක් බඳවා ගැනීම කළ යුතුය. | ඉදිරියේ දී මෙම අංශය යටතේ සේවයේ යෙදෙන සියලු නිලධාරීන්ගේ සේවයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා ඔවුන්ගේ සාමාන්‍ය රැකියා විස්තරයට අමතරව ඒ ඒ ව්‍යාපෘති සඳහා 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි තාක්ෂණික විගණනයක් කිරීමේ බලය පැවරීමට කටයුතු කෙරේ. |
| (ඇ) | 2019 මැයි 09 දින කොන්ත්‍රාත් පදනමට බඳවා ගෙන ව්‍යාපෘති අංශයට අනුයුක්ත කළ ඉංජිනේරු උපදේශක (මාර්ග) 2019 ජුලි 24 දින සිට ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත කර රු.1,260,000ක වැටුපක් ගෙවා තිබුණ ද ව්‍යාපෘති අංශයට අදාළ රාජකාරි කිසිවක් ඉටු කර නොතිබුණි. | ගෙවන ලද වැටුප පිළිබඳ විමර්ශනයක් කළ යුතුය. | ගරු අමාත්‍යතුමා විසින් කරන ලද ඉල්ලීමක් අනුව දිසිත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත කර දිස්ත්‍රික් ලේකම්ගේ සහතිකය මත වැටුප් ගෙවන ලදී. |